# බළන්ගොඩ නගර සභාව

## 2026.07.14 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2026.07.14**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2.ගරු උප සභාපති | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5.ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6.ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7.ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී පේමදාස මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 9.ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී ජයනක මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01.පසුගිය 2026.06.09 දිනැති මහ සභාවේ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව 2026-06-09 දිනැති මහා සභා වාර්තාව සහ 2026-06-26 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.මෙහි දී ගරු උප සභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2026-06-09 දිනැති මහා සභා වාර්තාව සහ 2026-06-26 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන් සංශෝධන ඉදිරිපත් කරන ලෙස දැන්වූ අතර ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ පසුගිය 2026-06-09 දිනැති මහ සභාවේ යෝජනා අංක 07:01:12 යටතේ තමන් ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමිය වෙත දැනුම්දෙන ලෙස පැවසුවද එය සටහන් වී නොමැති බැවින් ඒ අනුව එය ඇතුළත් කරන ලෙස පවසන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ 2026-06-09 දිනැති මහා සභා වාර්තාව පිටු අංක 03හි මන්ත්‍රීතුමා ලෙස නිවරදි විය යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ සභා වාර්තාව සකස් කරන විට සාරාංශ කර සකස් කිරීම සුදුසු බවත් පසුගිය සභාවේ යෝජනා අංක 07:01:12 යටතේ දෛනික වැටුප් පැහැදිලිකිරීම පිටු 13ක් පමණ වන බවත්, එය සාරාංශ කර ඉදිරිපත් කිරීම සුදුසු වන බවත්, තමන්ගේ ඉතිහාසයේ දැකපු ලොකුම සභා වාර්තාව මෙය බවත්, මේ සඳහා විශාල මුදලක් වැය වන බැවින් සාරාංශකර සකස් කිරීම වෙනුවෙන් අවධානය යොමුකරන ලෙසත්ය.

**ඒ අනුව ඉහත සංශෝනයන්ට යටත්ව 2026-06-09 දිනැති මහ සභා වාර්තාව සහ 2026-06-26 දිනැති විශේෂ මහ සභා වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

නිවේදන වාරය ආරම්භ කරමින් ගරු සභාපතිතුමා, 2024 වර්ෂයේ සබරගමුව පළාත් පාලන ආයතන වල කාර්යසාධනය ඉහළ නැංවීම වෙනුවෙන් සංවිධානය කරන පළාත් පාලන විශිෂ්ටයින්ගේ වාර්ෂික ස්වර්ණමය අභිෂේකය 'රන්අස්වනු' සම්මාන ප්‍රණාම උළෙල හෙට දිනයේ එනම් ජූලි 16 වනදා පස්වරු 1.00 ට සබරගමුව පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන බවත්, ඒ සඳහා ආරාධනාවක් ලැබී ඇති බවත්, එය ගරු සබරගමුව පළාත් ආණ්ඩුකාර චම්පා ජානකී රාජරත්න මැතිණිය, ගරු පරිසර ඇමති අමාත්‍ය වෛද්‍ය ධම්මික පටබැඳි මැතිතුමා, ගරු බුද්ධශාසන ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු

අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා, රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ශාන්ත පද්මකුමාර මැතිතුමා ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බවත්, ඒ සඳහා සභාවේ ක්ෂේත්‍ර 08ක් සඳහා ආරාධනා ලැබී ඇති බවත්, එම කණ්ඩායමට අමතරව තවත් 6 දෙනෙකුට සහාභාගී විය හැකි බවත්, ඒ සඳහා මන්ත්‍රී කණ්ඩායමේ නියෝජනයකුත් සම්බන්ධ කළ හැකි බවත්ය.

බලංගොඩ මුස්ලිම් දේවාස්ථාන පරිපාලන සභාව විසින් පසුගිය හජ් අමුත්තන්ගේ/අවුරුද්දේ ගවයින් කුර්බාන් කිරීමට තාවකාලික බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් මැදිහත් වූ සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට, මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ට ස්තූතිය පුද කර ඇති බවත්, නාගරික මන්ත්‍රීතුමන් වන ජුනයිදීන් මලීක්ෂා මැතිතුමන්ට ඒ සඳහා මැදිහත් වීම සම්බන්ධයෙන් විශේෂ ස්තූතියක් කර ඇති බවත් ගරු සභාපතිතුමා සභාව දැනුවත් කරමින් පැවසීය.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

මෙදින ගරු සභාවේ සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම.**

මෙදින ගරු සභාවේ සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම් නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

බළන්ගොඩ නගර සභාවට අයත් දෙහිගස්තලාව මුස්ලිම් සුසාන භූමිය අසළින් දිවෙන එෆ්.එච් මාවත සංවර්ධනය කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙක් තෝරා ගැනීම සඳහා අදදින ටෙන්ඩර්පත් විවෘත කිරිමට යෙදී තිබුනද කිසිඳු ලංසුපතක් නිකුත් වී නොතිබූ බැවින් විවෘත කිරීමට ටෙන්ඩර්පත් නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී. ඒ අනුව එකී කර්මාන්තය ඉටු කිරීම සඳහා ලංසුපත් ඉදිරිපත් නොවීම හේතුවෙන් ලංසුපත් ඉදිරිපත් කිරීමේ කාලය දීර්ඝ කර නැවත ලංසු කැඳවීම සුදුසු බවට වන ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණය ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කල් දී ඇති යෝජනා**

<u>**06:01** ගරු සභාපති එන්.ඩබ්.පී.ටී.ජයසේන මැතිතුමා</u>

**06:01:01** බළන්ගොඩ පෙට්ටිගල මාර්ගය "වටද්දර ශ්‍රී ඥානිස්සර නාහිමි මාවත" නමින් නම් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත යෝජනාව විශේෂ යෝජනාවක් ලෙස පසුගිය මහ සභාවේදී ඉදිරිපත් වූ බවත්, ගරු පූජ්‍ය ගැටඅරළුවේ සංඝරක්ඛිත ස්වාමීන් වහන්සේ විසින් එකී ඉල්ලීම යොමුකර ඇති බවත්ය.

එම ලිපිය මඟින් 2024.01.25 වැනි පෝය දින අපවත්වී වදාල ස්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ සබරගමුව පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක, දර්ශනවේදී, රාජකීය පණ්ඩිත, වටද්දර ශ්‍රී ඥානේශ්වර නායක ස්වාමීන් වහන්සේගෙන් සම්බුද්ධ ශාසනයට සහ බෞද්ධ ලෝකයාට සිදු වූ සේවාව අති විශාල බවත්, කූරගල මහා පුදබිම බෞද්ධ ලෝකයට දායාද කිරීම ඉන් එක් ප්‍රධාන කරුණක් පමණක් බවත්, බෝම්බුව බෝධි මණ්ඩලාරාම පුරාණ විහාරස්ථානයේ වැඩසිටිමින් නගරවාසීන්ට මෙන්ම ප්‍රදේශයට සිදුකළ ශාසනික සේවය අමතක කළ නොහැකි බවත්, එසේ හෙයින්, මෙම මහඟු සේවාවන්ට උපහාරයක් ලෙස දැනට පෙට්ටිගල පාර යනුවෙන් භාවිත කරනු ලබන මාර්ගය "වටද්දර ශ්‍රී ඥානේශ්වර නාහිමි මාවත" යනුවෙන් නම් කිරීමට අවශ්‍ය කටයුතු පිළියෙල කර එම කටයුත්ත ඉටුකර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්,එහි නාගරික මන්ත්‍රීවරු සියලු දෙනාගේ සහයෝගය ලැබෙතැයි අපේක්ෂා කර ඇති බව දන්වා ඇති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ වටද්දර ශ්‍රී ඥානේශ්වර නායක ස්වාමීන් වහන්සේ බෞද්ධ ශාසනයට ඉමහත් සේවාවක් සිදු කළ බවත්, එබැවින් මහානායක ස්වාමීන් වහන්සේගේ ඉල්ලීමට සභාවේ සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ගෞරව පූර්වකව ඉල්ලා සිටින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා සඳහන් කලේ පෙට්ටිගල පාර නගර සභා සීමාවේ පවතින්නේ කිලෝමීටරයක් හෝ එකහමාරක් පමණක් බැවින් මේ පිළිබඳව ප්‍රාදේශීය සභාවටද දැනුම් දීමක් සිදු කිරීම සුදුසු බවත්, මෙය නිවාස කුඩා ප්‍රමාණයකට තිබෙන කුඩා මාර්ගයක් නොව ප්‍රධාන මාර්ගයක් වන පෙට්ටිගල පාර,වටද්දර ඥානිස්සර නාහිමි මාවත නමින් නම් කිරීමට යන බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ එතුමාගේ පැහැදිලි කිරීම නිවරදි බවත්, මෙය වීථි නම් කිරීම් පනත යටතේ ගැසට් කිරීමට කළ නොහැකි බවත්, එසේ නම් එය පළාත් සභාවෙන් ගැසට් කළ යුතු බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්

විමලසිරි මැතිතුමා සඳහන් කලේ තර්ක කිරීමක් නොව එසේනම් මස්සැන්න පාර, ආනන්ද මෛත්‍රී මාවත යනුවෙන් නම් කර ඇත්තේ කෙසේද එයත් පළාත් සභා මාර්ගයක් යන්නයි.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ඒ කිසිවක් ගැසට් කර නොමැති බවත්, නමුත් එම මාර්ග නම් කර ඇති බවත්, තමන් මේ සඳහා විරුද්ධ වනවා නොව පවතින නීතිමය තත්වය පැහැදිලි කිරීම පමණක් බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ පෙට්ටිගල පාරට කාලයක් ගතවනවිට වටද්දර ඥානිස්සර ස්වාමීන් වහන්සේගේ නම භාවිතා කරනු ඇති බවත්ය. මස්සැන්න පාරට මස්සැන්න පාර, උඩුමුල්ල පාර, මෙන්ම ආනන්ද මෛත්‍රී මාවත ලෙසද භාවිතා වන බවත්,එය ප්‍රශ්නයක් වී නොමැති බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:02** ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර ඇති රු. මිලියන 10ක මුදල නැවත ආයෝජනය කිරීමට සුදුසු බැංකුවක් තෝරා ගැනීම සඳහා බැංකු වලින් ලබා ගන්නා ලද එක් එක් කාල පරිච්ඡේදයන්ට අදාළව පොලී අනුපාත පහත පරිදි ලැබී ඇත. ඒ අනුව ආයෝජනය කිරීම සම්බන්ධව තීරණය කිරීම.

| බැංකුව | මාස 01 | මාස 03 | මාස 06 | මාස 07 | මාස 12 |
|---|---|---|---|---|---|
| මහජන බැංකුව | 6.75% | 7.25% | 7.5% | - | 8.5% |
| ලංකා බැංකුව | 6.75% | 7.25% | 8% | - | 7% |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 7.25% | 8.5% | 8.75% | 10.25% | 10.25% |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ සභාවේ අත්‍යවශ්‍ය නඩත්තුවන් සිදු නොකර රුපියල් කෝටියක් ස්ථාවර තැන්පත් තබන්න යන බවත්, ලක්ෂ පහ බැගින් මන්ත්‍රී ප්‍රතිපාදන මුදල් අයවැයෙන් වෙන් වුවද ඒවා ඉටු නොවන බවත් පැවසූ අතර ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසුයේ අත්‍යවශ්‍ය කාරණ පැවතියද කෝටියක මුදලක් පැවතියද එය වියදම් කළ නොහැකි බවත්, එසේ තැන්පත් කරන මුදල් ප්‍රමාණය සම්බන්ධව සභාව ඒකමතිකව තීරණය කරනවා නම් එය ගැටළුවක් නොවන බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම මුදල් මහජනතාවගේ මුදල් බවත්, එලෙස උපයා ගත් මුදල් ජනතාවගේ සේවයටම යෙදවිය යුතු බැවින් රුපියල් ලක්ෂ 50ක් රැගෙන සභාවේ වැඩ කිරීමටත් ඉතිරි මුදල ආයෝජනය කිරීම සුදුසු බවත් තමන්ගේ අදහස වන බවත් පවසන ලදී.

ගමට, නගරයට සේවයක් කිරීමට මන්ත්‍රීවරු ලෙස පත්වී පැමිණියත්, දැනට තමන් ඇතුළු සභාව පත්වී අවුරුද්දයි මාස දෙකක් පමණ ගත වුවත්, එලෙස කිසිම සංවර්ධන වැඩක් කිරීමට මුදල් නොලැබුන බවත්, සභාපතිතුමන්ගේ දේශපාලන අධිකාරිය හරහා සංවර්ධනය වෙන නමුත් මන්ත්‍රීවරුන් හරහා කොට්ඨාසවලට කිසිදු සංවර්ධනයක් තවම සිදුවී නොමැති බවත්, තමන් 2025 වර්ෂයේ ලබාදුන් යෝජනා මෙන්ම 2026 යෝජනාවත් තවම ක්‍රියාත්මක නොමැති බවත්, එබැවින් තමන්ද පවසා සිටින්නේ උපසභාපතිතුමා පැවසූ පරිදි ස්ථාවර තැන්පත් මුදලින් 50%ක් තැන්පත් කර, 50%ක මුදලින් ගමට ජනතාවට අත්‍යවශ්‍ය වැඩ කිරීම සුදුසු බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා සඳහන් කලේ ජනතාව බදු මුදල් ලබා දී ඇත්තේ ස්ථාවර තැන්පතුවල ආයෝජනයට නොවන බවත්, මෙම දිනවල සභාවේ මූල්‍ය තත්වය අනුව ගෙවීමට නොහැකිව බිල් විශාල ප්‍රමාණයක් පවතින බවත්, ලක්ෂ 88ක බිල් පවතින බවත්, එසේ තිබියදී අපි බැංකුවල එහෙම ඩිපොසිට් කරලා තේරුමක් නැති බවත්, ස්ථාවර තැන්පතුවලට ලොකු පොලියක් ලැබෙන්නේද නැති බවත්,එබැවින් මෙයින් මිනිස්සුන්ට වැඩක් කරන ලෙසත්, මීන් පෙරද ඊ.ඒ.එල් මහත්තයා විශාල මුදල් ප්‍රමාණයක් තැන්පත් කර තිබුනද ආනන්ද සභාපතිතුමා පැමිණ එම මුදල් වලින් වැඩ කළ බවත්, ඒ අනුව මේ පිළිබඳව සභාපතිතුමාට තීරණය කළ හැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ මෙම මුදලින් පාරවල් හදනවා වගේ වැඩ නොව පොදු වෙළඳසැළ නවීකරණය වැනි ව්‍යාපෘතියකට ආයෝජනය කිරීම සුදුසු බවත්, පසුව එම ආයෝජනයෙන් ලැබෙන මුදලින් අපිට තව පාරක් හදන්න වගේ වැඩ කිරීමට හැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ රුපියල අවප්‍රමාණය වීමත් මෙය මුදල් ස්ථාවර තැන්පත් කරනවාට වඩා ඩොලර් ටිකක් අරන් තියන එක සුදුසු බවත්, එතරම් ඉක්මනට රුපියල බාල්දු වන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් මේ වන විට සභාවට ස්ථාවර තැන්පතු කීයක් තියෙනවාද? මෙම මිලියන 10ට අමතරව තවත් දාලා තියෙනවාද? බැංකුව කුමක්ද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් දැනට මෙම රු.මිලියන 10 තැන්පත් කර ඇත්තේ ලංකා බැංකුවේ බවත්, ඒ අනුව

ඉදිරියට තැන්පත් කිරීම සම්බන්ධයෙන් මෙහිදී තීරණය කළ යුතු බවත්, වෙනත් ස්ථාවර තැන්පතු නොමැති බවත් පවසන ලදී.

පසුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ මෙම රු.මිලියන 10න් මිලියන 5ක් රගෙන මේ වන විට බිල් ගෙවා ඇති බව තමන් මෙම අවස්ථාවේ පවසන බවත්, එසේම එය අනුමැතියක් නැතුව සිදු කර ඇති බවත්, මුදල් පාලන බලතල ඇත්තේ සභාවට බවත්, එසේ කර ඇත්ද නැද්ද කියලා යන්න පිළිබඳව සභාපතිතුමා සභාවට පවසන ලෙසත්ය.

නැවතත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැඟී සිටිමින් තමන්ට එයට පිළිතුරක් ලබා දෙන ලෙසත්, එසේම ගණකාධිකාරීතුමියට නගර සභාවෙන් දීමනාවක් ගෙවන බවත්,නමුත් අද පැමිණ නැති බවත්, මුදල් පාලනය සම්බන්ධව මෙහි සම්පූර්ණ මුදල් බලතල පවතින්නේ සභාපතිට නොව සභාවට බවත්, එසේ තිබියදී සභාව නොදැනුවත්ව මෙලෙස මිලියන 10න් මිලියන 5ක් අරගෙන තියෙනවාද යන්නට පිළිතුරක් ලබා දෙන ලෙසත් පවසන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ එය බරපතල ප්‍රකාශයක් බවත්, සභාවේ වියදම් සම්බන්ධයෙන් බලධාරියා සභාපතිතුමා බවත්, ඒ අනුව සභාපතිතුමා නොදැනුවත්ව එහෙම වෙලා තියෙනවා නම් අනිවාර්යයෙන් ඒ පිළිබඳව සභාව දැනුවත් කරන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසූයේ ඉහත මන්ත්‍රීතුමා මේ පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධව සතුටු වන බවත්, මේ සම්බන්ධව පිළිතුර දැනගන්න අවශ්‍ය බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ සභාවේ මෙහි සමහර කාරණා සම්බන්ධව දැනුවත් වීමට කලින් එළියට යනවා කියලා ජේන බවත්, තමන්ද ඇත්තටම ඒ පිළිබඳ නොදැනුවත් බවත්ය.

ගරු සභාපතිතුමා මෙම අවස්ථාවේ ගිණුම් අංශයේ නියෝජිතයෙකු සිටින බැවින් ඒ පිළිබඳව විමසීම් කිරීම වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

එකී ස්ථාවර තැන්පත් මුදල වන රු.මි.10 මුදල දැනට තැන්පතුවක් ලෙස පවතින බවට අදාළ විෂය නිලධාරී කරුණු පැහැදිලි කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විමසුයේ ස්ථාවර තැන්පත් මුදල ආයෝජනය කරනවාද ප්‍රාග්ධන වියදම් සඳහා යොදා ගන්නවාද යන්න පිළිබඳව තීරණය කළ යුතු බවයි.

ගරු සභාපතිතුමා පැවසුයේ එසේ වුවද මිලියන 10ම ඒ සඳහා යෙදවිය නොහැකි බවත්, හදිසි අවස්ථාවක් සඳහා මුදලක් තිබිය යුතු බවත්, ඉදිරියේදී මිලියන 5කට ආසන්න මුදලක් හෝ එවැනි පොදු සුභසාධනයක් සඳහා යොමු කිරීම පිළිබඳව සලකා බලන බවත්, ඊට අමතරව අපි සභාවේ මුදල් නොයෙදුවා වුවත් පළාත් පාලන අමාත්‍යාංශය හරහා අරමුදල්වලින් ව්‍යාපෘති ලැබෙන බවත්, දැනටත් අපිට ව්‍යාපෘති 19ක් පමණ ලැබී ඇති බවත්, එබැවින් ගම්වල වැඩ නොකරනවා කියලා කියන්න බැරි බවත්, නමුත් ඒවා තමන්ගේ වැඩක් විදිහට කරගන්න නොහැකි වීම වගේ අදහසක් සමහරුන්ට ඇති බවත්, එයින් දැනට ඇස්තමේන්තු සකස් කරන ව්‍යාපෘති 10ක් ඇති බවත්, ඩෙක්මා ආයතනය හරහා ව්‍යාපෘති 3කට මේ වන විට ඇස්තමේන්තු සාදා අවසන් කර ඇති බවත්, එබැවින් ගම්වල වැඩ කෙරෙන බවත්, නමුත් ප්‍රශ්නය වී ඇත්තේ ඒවා තමන්ගේ වැඩක් විදිහට කෙරෙන්නේ නෑ කියන අදහස බවත්, නමුත් තමන්ගේ වැඩක් කියලා එහෙම කෙරෙන්න අවශ්‍යත් නැති බවත්, ඒවා අපි හැමෝගෙම වැඩ බවත්, ආණ්ඩුවෙන් ලබාදෙන මුදල් බැවින් අපි හැමෝම එකතු වී මෙම වැඩේ කරමු යන්නත්, ගමේ වැඩ කෙරෙනකොට හැමෝම ඊට සම්බන්ධ වන ලෙසත්, මෙහිදී පක්ෂ භේදයක් නැති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ සභාපතිතුමා පැවසූ පරිදි පළාත් පාලන අමාත්‍යාංශයෙන් සංවර්ධන මුදල් පැමිණ ඇති ව්‍යාපෘති යෝජනා ටික මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලෙසත්, එසේ නොමැති හෙයින් අපි මෙහෙම කතා කරන බවත්, නැත්නම් ගමට වැඩ කෙරෙනවා නම් එච්චරයි අපිත් කැමතියි යන්නත්, ඒ පිළිබඳව දැනුවත් කිරීම තුළින් නගර සභාව හරහා මෙම වැඩ කෙරෙන බවට මිනිස්සුන්ට පැවසිය හැකි බවත්ය.

ඒ අනුව 2026 වර්ෂයට අදාළ පළාත් සභා කර්මාන්ත යටතේ ලැබී ඇති ව්‍යාපෘති ලෙස පහත ව්‍යාපෘතිද,

- ❖ දෙහිගස්තලාව මුස්ලිම් සුසාන භූමිය අසලින් දිවෙන ෆලීල් හාජ්ජියාර් මාවත සංවර්ධනය කිරීම
- ❖ දෙල්ගස්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම කිරීම
- ❖ වැවවත්ත උද්‍යානය, දෙවන පටුමඟ තාර දමා සංවර්ධනය කිරීම
- ❖ පල්ලේකුඹුර මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම
- ❖ ඉත්තැගලහේන මාර්ගයේ කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම
- ❖ නගර සභා කාර්යාලයේ විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම

❖ ගලිටැංකිය අලුත්වැඩියා කිරීම සහ පින්තාරු කිරීම

පරිපූරක ඇස්තමේන්තුව යටතේ පහත ව්‍යාපෘතිද,

- ❖ පුරණගෙදර උඩපාර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.
- ❖ දෙහිගස්තලාව කතෝලික පල්ලිය අසලින් තුරුසෙවන පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීම.
- ❖ ඕලුගංතොට නාන තොටුපොළෙ නාගරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම.
- ❖ සිටිගාර්ඩන් මාර්ගය කාණු පද්ධතිය සකස් කිරීම සහ මාර්ගය සංවර්ධනය කිරීම.
- ❖ ධර්මානන්ද පිරිවෙන අසල සිට කුමාරගම මාර්ගය සංවර්ධනය කිරීම.
- ❖ දෙහිගස්තලාව ආදිල් මහතාගේ ගරාජය අසල සිට ඉර්ෂාඩ් මහතාගේ නිවස දක්වා මාර්ගය දෙපස කාණු සහිතව සංවර්ධනය කිරීම.
- ❖ ගමගෙදර පාර පැතිබැම්ම ඉදි කිරීම.
- ❖ අස්සැද්දුම මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම.
- ❖ පල්ලේවෙල මාර්ගය මීටර් 400 ක් දක්වා සංවර්ධනය කිරීම.
- ❖ කරව්කැටිය සිට උඩකන්ද මාර්ගය හරහා කාණු පද්ධතිය සහ මාර්ගය සංවර්ධනය කිරීම (නගර සීමාව දක්වා)

ඊට අමතරව ලක්ෂ 50 ට වඩා වැඩි ඇස්තමේන්තු සකස් කිරීම ඩෙක්මා ආයතනයෙන් සිදු කරන බවත්,ඒ යටතේ

- ❖ අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීම.
- ❖ සඳුන්ගම මාර්ගය සංවර්ධනය කිරීම.
- ❖ අනදමෙත්ගම සිට සියඹලාගහවත්ත කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.
- ❖ මුල්ගෙදරවත්ත මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.
- ❖ 01 කණුව අසල සිට කුමාරගම තලංගම මාර්ගය උරස්තල කොන්ක්‍රීට් කර කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.

යන ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, එම සියලු ව්‍යාපෘති අපේ නගර සභා සීමාව ඇතුළේ තිබෙන සංවර්ධන වැඩසටහන් බවත්, ඊට අමතරව පසුගිය වසරේ බැංකියවත්ත යන්ත්‍ර උපකරණ නඩත්තුවට වෙන් වූ මුදලක් පවතින බවත්, එය පසුගිය වසරේ සිදුකිරීමට නොහැකි වූ බවත්, නැවත එය මෙම වසරේ සිදු කර ගැනීමට හැකි බවත්, ඒ සඳහා රු.ලක්ෂ 29 ක මුදලක් වෙන් වී ඇති බවත් ගරු සභාපතිතුමා සභාව දැනුවත් කරමින් පවසන ලදී.

ඒ අනුව මිලියන 76 කට අධික ප්‍රමාණයක ව්‍යාපෘති 20 ක් ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත බවත්, ඊට අමතරව ඉදිරියේදීත් පරිපූරක ප්‍රතිපාදන මුදල් ලැබෙන බවත්, එයින්

සභාවේ සියළු දෙනාගේම ව්‍යාපෘති මේ හරහා ක්‍රියාත්මක වන බවත්, එබැවින් කාගේද කියන එක අදාළ නැති බවත්, අපි හැමෝගෙම නගරය තමයි සංවර්ධනය වන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ 2026 වර්ෂයට අදාළ මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනා ලබාගත් බවත්, එය අයවැය ලේඛණයේ පරීක්ෂා කළ බවත්, දැනට මාස 6 ක් ගතවුවද මන්ත්‍රීවරුන්ගේ එම යෝජනා ක්‍රියාත්මක කර නැති බවත්, පසුගිය සභාවේ හර්ෂණ මන්ත්‍රීතුමා මෙම ලක්ෂ 5 සංවර්ධන යෝජනා පටන් ගන්නේ කවදාද යන්න විමසීමේදී ගරු සභාපතිතුමා තමන්ගේ සහ නදීක මන්ත්‍රීතුමාගේ යෝජනාව මෙම මස පටන් ගන්නා බව පැවසූ බැවින් සභාපතිතුමා විශ්වාස කරලා එය ගමේ මිනිස්සුන්ට පැවසූ බවත්, නමුත් තවම පටන් ගෙන නැති බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ සභාවේ මුදල් සම්බන්ධව අනපේක්ෂිත වියදම් පැමිණි බැවින් මෙම දිනවල සභාවේ මුදල් ගැටලු ඇතිවූ බවයි.

ඉහත මන්ත්‍රීතුමා පැවසූ දේ ඇත්ත බවත්, පාරේ යන්න නැහැ, කවුරුත් සැහෙන දොස් කියන බවත්, ජනතාවට පොරොන්දු දුන් බැවින් එහිදී අසරණ වන බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසීය.

මෙහිදී ගරු සභාපතිතුමා ස්ථාවර තැන්පතු සම්බන්ධව මතුකළ ගැටළුවට පිළිතුරු ලබා දෙමින් ස්ථාවර තැන්පතු මිලියන 10ට අදාළ රිසිට් 10 ක් පවතින බවත් ඒවා පරීක්ෂා කර බැලිය හැකි බවත් පවසන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ගරු නාගරික මන්ත්‍රී හෙට්ටිආරච්චි මැතිතුමා කරපු චෝදනාව බරපතල චෝදනාවක් බවත්, කාර්යාලයේ යම්කිසි සාවද්‍ය තොරතුරක් එළියට ගිහින් ඒක පදනම් කරගෙන තමයි එතුමා කතා කරන බවත්,මේ කතා කරන්නේ බළන්ගොඩ නගර සභාවේ මහා සභා වාරයේ බවත්, ඒ අනුව කවුරුන් හෝ එතුමා නොමඟ යවා ඇත්නම් කාර්යාලයෙන් සාවද්‍ය තොරතුරු ලබාදීම මත බළන්ගොඩ නගර සභාවේ ස්ථාවර තැන්පතු වලින් ලක්ෂ 50 ක මුදලක් අතුරුදහන් වී ඇති බව මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළ බවට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පැමිණිල්ලක් දැමීමට තමන් යෝජනා කරන බවත්ය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ ඉතා හොඳ යෝජනාවක් බවත්,අදම පැමිණිල්ල දාන ලෙසත්, පැමිණිල්ල දාපුවාම තමන් වීඩියෝ සාක්ෂි සහිතව එය ලබා දෙන බවත්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නෙමෙයි, ඕන තැනක ගොස් පැමිණිල්ල දාන ලෙසත්, එතකොට තමන්ටත් මෙය පහසුවන බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ මෙම ස්ථාවර තැන්පතුව කල් පිරෙන්නේ 2025.05.22 බවත්, අද 2026.07.14 බැවින් ඒ අනුව එම කාලයට අදාළ මොකක්ද වුනේ යන්නත්, මෙම ස්ථාවර තැන්පතුව auto renew වනවානම් එය මෙහි තිබිය යුතු බවත්, 2025.05.22 කල් පිරෙන බවත්, අද 2026.07.14 බවත්, ඒ අනුව තමන් විමසුයේ අද බවත්, එයද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට කියන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් එය auto renew වෙන්න දාලා තියෙනවාද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ එය නැවත අලුත් කිරීම පිළිබඳව තීරණය වෙනුවෙන් සභාවට යොමු කර ඇති බවයි.

එතුමා පවසන්නේ ස්ථාවර තැන්පතු මුදලින් ලක්ෂ 50ක මුදලක් සභාව නොදැනුවත්ව රැගෙන වියදම් කර ඇති බව බැවින් ඒ පිළිබඳව සභාවටද ප්‍රශ්නයක් මතුවන බැවින් සභාව දැනුවත් කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත පුෂ්පකුමාර මැතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුයේ තමන්ද මෙම අවස්ථාවේ පවසන්නේ, අදට මෙම ස්ථාවර තැන්පතුවේ ලක්ෂ 50ක් පමණක් තිබෙන බවත්, තමන්ද එය දැක්ක බවත්, ඒ අනුව තමන්ටත් එහි ලක්ෂ 50ක් පමණක් තිබෙන බව ස්ථිරවම කිව හැකි බවත්,දාන පැමිණිල්ලක් තමන්ටත් දාන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් පැවසුයේ, අදවන විට මෙම ස්ථාවර තැන්පතුවේ පවතින්නේ ලක්ෂ 50ක් පමණක් බවයි. මෙම අවස්ථාවේදී ගිණුම් අංශයේ නිලධාරියා මඟින් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමන්ගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

එහිදී ගිණුම් අංශයේ නිලධාරී මහතා ප්‍රශ්නගත ස්ථාවර තැන්පතු මුදල වන රු.මිලියන 10ක මුදල ස්ථාවර තැන්පතුවක් ලෙස සභාවේ ගිණුමක පවතින බවට ස්ථිරවම පවසන ලද අතර ඒ පිළිබඳව බැංකුව මඟින් තහවුරු කිරීම් ලිපියක් ලබා ගැනීම සුදුසු බවට සභාව තීරණය කළ බැවින් ගරු සභාපතිතුමා විසින් ලේකම්තුමියට එකී ලිපිය රැගෙන ඒමට දන්වන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන්ගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙහිදී ලංකා බැංකුව විසින් ලබාදෙන ලද ස්ථාවර තැන්පතු තහවුරු කිරීමේ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර එතුමා පැවසුයේ එහි රු.මි 10ටම අදාළ වවුචර්පත් තිබෙන බවත්, අවශ්‍යනම් පරීක්ෂා කළ හැකි බවත්, කුමන හෝ කාරණාවකට

තොරතුරු ලබා ගැනීමේදී විශ්වාසනීයත්වය පිළිබඳව තහවුරු කරගන්නා ලෙසත් මෙවැනි දේවල් සිදු වීමේදී සභාවත් නොමඟ යවන බවත්,ඉදිරියට එවැනි තත්වයන් ඇතිනොවන තැනට වගබලා ගත යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ තමන් යම්කිසි කාරණාවක් පෙන්වා දුන් බවත් ඒකේ නිවැරදිභාවය බාරගැනීම සභාතුමාගේ කාර්යයක් බවත්, එමෙන්ම තමන් අල්ලස් එකට නොව ඕනෑ තැනකට පැමිණිලි කරන ලෙස දැනටත් කියන බවත්, තමන්ට ඒ සම්බන්ධව ලබාදිය හැකි සාක්ෂි පවතින බවත්, එය වැරදිනම් ඒ සම්බන්ධව ගත හැකි ඕනෑම පියවරක් ගන්නා ලෙසත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධව කුමන බැංකුවක කෙතරම් කාලයකට කොපමණ මුදලක් ආයෝජනය කරනවාද යන්න පිළිබඳව අවසාන නිගමනයට එළඹිය යුතු බැවින් ඒ පිළිබඳව තීරණය කරන ලෙසත්, ලබාදී ඇති තොරතුරු අනුව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වැඩි පොලී ප්‍රතිශතයක් ගෙවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ මහජනතාව නගර සභාව විශ්වාසය කර සැපයූ බිල්පත් ගෙවීමට ඇති බැවින් ලක්ෂ 50ක් රැගෙන එම ණය ගෙවා ඉතුරි මුදල සාකච්ඡා කරලා තැන්පත් කිරීම සුදුසු බව පැවසූ අතර ගරු සභාපතිතුමා පැවසූයේ අවශ්‍යනම් ඒ ආකාරයට ලක්ෂ 50ක් අරගෙන බිල් ගෙවීම් කර ඉදිරියේදී ලැබෙන මුද්දර ගාස්තු ලැබෙන බැවින් ඒ මුදලින් නැවත වරක් මිලියන 50 තැන්පත් කළ හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් එම ණය මොනවාද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ ණය නොව බිල්පත් ගෙවීමට ඇති බවයි.

මෙම ස්ථාවර තැන්පත් මුදල් රැගෙන ගෙවීමට ඇති බිල් ටික ගෙවීමට පවසනවාද යන්නත් සභාවේ තැන්පතු රැගෙන එලෙස බිල් ගෙවන්නේ නම් මෙහි තියෙන ටික විකුණ විකුණ බිල් ගෙවුවම හරිද යන්නත්, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ තමන් පවසන්නේ ඒවා මිනිස්සුන්ට ලබා දෙන්න ඕන තියෙන සල්ලි බවත්, නැතිනම් නගර සභාවට චෝදනා කරන බවත්ය.

දිගටම මෙම මුදල් බැංකු වල ස්ථාවර තැන්පත් කර පොලී රැගෙන බැංකුව සතුටු කර මහජනතාවගේ බැනුම් ඇහීමට අවශ්‍ය නැති බවත්, මන්ත්‍රීවරු පත් කර ඇත්තේ මහජනතාවට සේවය කිරීම සඳහා බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ ලක්ෂ 88ක පමණ බිල් ගෙවීමට ඇති බවත්, නමුත් ඉදිරි මස කඩකුලී ලැබෙන බැවින් එයින් ගෙවීම් කළ හැකි බවත්, ඒ අනුව කෙටි කාලයකට මුදල් ගැටළුව පවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ මෙයින් ආයෝජනයක් සිදු කරන ලෙසත්, ඒ අනුව එයින් ලැබෙන ආදායමෙන් නඩත්තු වැඩ හෝ සිදු කළ හැකි බවත්, පාරවල් වල යන්න බැරි බවත්, මිනිස්සුන්ගේ සල්ලි බැවින් ස්ථාවර තැන්පතුවල දමා තේරුමක් නැති බවත් මේවායින් වැඩ කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසුයේ ස්ථාවර තැන්පත් කර තැබීම සුදුසු බවත්, වියදම් කළ හැකි නමුත් වියදම් කළ පසු මුදල් ඉවර වී සභාවට කිසි දෙයක් නැතිවන බවත්, හිටපු සභාපති ඊ.ඒ.එල් මහත්තයාත් ලොකු අරමුණකින් මෙහි මුදල් තැන්පත් ලෙස රඳවාගෙන සිටි බවත්, එසේ තිබීමෙන් ණය මුදලක් වුවත් ලබා ගත හැකි බවත්,ඒ බලාපොරොත්තුවෙන් එතුමා එය කළ බවත්, එතුමා දක්ෂ සභාපතිතුමෙක් බවත්, නමුත් එතුමා පසුව පැරදුන බවත්, එබැවින් තමන් පවසන්නේ මෙම මුදල් රැගෙන මාසයකින් ඉවර කළ හැකි වුවත් එවැනි මුදලක් ආපසු අපිට තැන්පත් කිරීමට නොහැකි බවත්, එය තිබීම අපට විශාල ශක්තියක් බවත්, එබැවින් මෙම මුදල් වියදම් කරනවාට තමන් කැමති නැති බවත්, එය වියදම් නොකරන ලෙසත්, පසුව මෙය ඇපයට තබා බැංකු ණය මුදලක් වුවත් ගත හැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුයේ මෙම ස්ථාවර තැන්පත් මුදලේ කල් පිරීමේ දිනය 2026/11/25 බවත්, මෙහි මාස දෙකකට කලින් සිට මෙය කුමන බැංකුවලට දාන්නේ, පොලිය වැඩි කොහෙද යන්න බලන බවත්, තමනුත් බැංකුවල ගනුදෙනු කරන බවත්, ස්ථාවර තැන්පතුවක් තියලා ණයක් ගන්න ගැනීමට හැකි බවත්, මේකේ සල්ලි අරන් තියෙන්නේ යන්න තමන් දැනුත් පවසන බවත්, 2024 සිට 2026 වන තෙක් මෙය දමා ඇති බවත්ය.

ගරු සභාපතිතුමා මෙහිදී රු.මි.10 ස්ථාවර තැන්පතුවේ කල් පිරීමේ වර්ෂය පිළිබඳව පැහැදිලි කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් මෙම ලක්ෂ ලක්ෂ 100 ස්ථාවර තැන්පතුවට අමතරව තවත් ස්ථාවර තැන්පත් තිබේද කියන්නත් මේ සම්බන්ධව හරි තොරතුරු ලබා දෙන ලෙසත් පවසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ එතුමියන්ලා ලබා ගන්නා තොරතුරු නිවරදිව ලබා ගන්නා ලෙසත් තමන් විසින් ඉදිරිපත් කරන ලද්දේ ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද තහවුරුව බවත් ඊට වඩා ප්‍රශ්න කිරීමට අවශ්‍ය නොවන බවත්ය.ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමට තමන්ට අයිතිය ඇති බවත් අකුරු තුනේ වචනෙකුත් දාලා සභාපතිතුමාගේ විදිය පෙන්වන ලෙස වෙනත්

අය පැවසුවද ඒවාට තමන් බය නැති බවද සභාපතිතුමා මීට අදාළව පිළිතුරු ලබා දෙන ලෙසද ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුවේ උදේ සිටම ස්ථාවර තැන්පතුවක් සම්බන්ධව කතා කරන බවත් සභාව නොදැනුවත්ව එම ස්ථාවර තැන්පතුවෙන් රුපියල් ලක්ෂ 50 මුදලක් වියදම් කර ඇති බවට හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා චෝදනා කරන බවත් ගරු සභාපතිතුමා මැදිහත්වී ඒ පිළිබඳව බැංකුව මගින් තහවුරුවක් ගෙන්වා ඉදිරිපත් කල බවත් එම මිලියන 10ට අදාළව තහවුරුව එහි පවතින බවත් එම මන්ත්‍රීතුමා පවසන ආකාරයට එක්කෝ වෙනත් ස්ථාවර තැන්පතුවක් තිබිය යුතු බවත් නමුත් එසේද නොමැති බවත් එක්කෝ එතුමාට ලබාදී ඇති තොරතුරු සම්පූර්ණයෙන්ම වැරදි බවත් එතුමා පැහැදිලිවම ලක්ෂ 50 ක මුදලක් ස්ථාවර තැන්පතුවෙන් ලබාගෙන ඇති බවට චෝදනා කළ බවත් ඊට අදාළ වීඩියෝ සාක්ෂි පවතින බව පුන පුනා පැවසූ බවත්,මෙසේ පවසන්නේ බලංගොඩ නගර සභාවේ මහා සභා වාරයේදී බවත් එසේනම් මේ ඉදිරිපත් කළ බැංකු තහවුරු ලිපිය අසත්‍ය වාර්තාවක් විය යුතු බවත් ඒ අනුව මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුවේ මෙහි ස්ථාවර තැන්පතුව මෙන්ම තවත් අය ශීර්ෂ වල මුදල් පවතින උදාහරණයක් ලෙස බවත් කසළ ටෙන්ඩරයට මුදල් ගෙවිය නොහැකි වුවහොත් වෙනත් අයශිර්ෂවලින් වලින් මුදල් මාරු කර ගෙවන බවත් ,එසේම ස්ථාවර තැන්පතු කළ විට කල්පිරෙන වගතෙක් ඒවා ලබා ගත නොහැකි බවත් හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ස්ථාවර තැන්පතුවෙන් ලක්ෂ 50ක් රැගෙන ඇති බව පැවසුවද තමා පවසන්නේ එසේ ලබාගත නොහැකි බවත් ,එතුමාටද එම තොරතුරු එතුමා සතුව පවතිනවා මෙහි ඉදිරිපත් කළ හැකි බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ මෙය කල්පිරී ඇත්තේ 2025 වර්ෂයේදී බවත් පසුව එය ස්ථාවර තැන්පත් කර නොමැති බවත්ය.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුවේ ලක්ෂ 10 කොටස් 10ක් ලෙස මෙය ස්ථාවර තැන්පත් කිරීම සුදුසු බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් මෙම ස්ථාවර තැන්පතුව දමා ඇත්තේ මාසිකව පොලී ලැබීමේ පදනමටද නැතහොත් කල්පිරීමේදී පොලිය ලැබීමේ පදනමට යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධ කරුණු පැහැදිලි කරගැනීම වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම් එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.අදාළ කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

අනතුරුව මෙම රුපියල් මිලියන 10ක මුදල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 10.25% ක පොලියක් යටතේ මාස 07ක කාලසීමාවකට ආයෝජනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එස්. යූ.සී ජයනක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:01:03** බළන්ගොඩ වටරවුම් අලංකරණය සඳහා සින්ගර් ෆිනෑන්ස් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් වන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සින්ගර් ෆිනෑන්ස් ආයතනයෙන් ඔරලෝසු කණුව ඉදිරිපිට වටරවුම ,රා කඩය අසළ වටරවුම අලංකරණය සහ නව කොමර්ෂල් බැංකුව සහ B.O.C. බැංකුව ඉදිරිපිට ආරක්ෂිත වැටක් ඉදි කිරීමට මෙලෙස අනුමැතියක් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමා පැවසීය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:04** රත්නපුර මහා අධිකරණයේ විභාග වන නඩු අංක RA/17/2026 දරණ නඩුව සඳහා නීතිඥ එල්.එච් ප්‍රියංකා ගුණවර්නසූරිය මියගේ නීතිඥ සේවය ලබාගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් වන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙය විභාග වෙමින් පවතින නඩුවක්ද යන්න ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් විමසන ලදුව ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් HLW ඉන්ධන පිරිවුම්හල අසළ මායිමේ සිටින අය අතර පවතින අනවසර ඉදි කිරීමක් සම්බන්ධ නඩුවක් බවත්, එම අනවසර ඉදි කිරීම ඉවත් කිරීමට තීන්දුවක් පැමිණි බැවින් නැවත එම පාර්ශවය ඒ සම්බන්ධයෙන් අභියාචනා කරලා තිබූ බවත්, එම නඩු කටයුත්තට මෙම නීතිඥ සේවය ලබා ගන්නා බවත් ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් මෙම නීතිඥ මහත්මිය රත්නපුර මහා අධිකරණයේ නීතිඥවරියක්ද යන්නත්, කොපමණ මුදලක් අයකරනවාද යන්නත් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ මුලින්ම තොරතුරු ලබා දීමට රු.25,000ක්ද, පසුව එක් නඩු වාරයකට රු.10,000ක්ද අයකරන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:05** 2025 වාර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණනයෙන් ලද තත්ත්වාගණනය කළ මතය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:06** පළාත් පාලන කොමසාරිස්ගේ අංකය CLG/LG/3/6/15 හා 2026 .05.13 දිනැති ලිපියට අනුව බර වාහන රියැදුරු බලපත්‍ර හිමි කම්කරු තනතුරු දරන සේවක මහතුන් රියදුරු සේවයේ යෙදවීම සම්බන්ධයෙන් මෝටර් රථ පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කර රජයේ වාහනයක් පැදවීමට ඇති ප්‍රවීණතාවය පරීක්ෂා කරවා ගැනීමෙන් අනතුරුව සේවා අවශ්‍යතාවය මත වැඩක්ෂේත්‍ර කම්කරු ඩබ්.පී ධනුෂ්ක සංජීව පතිරණ මයා ,සෞඛ්‍ය කම්කරු ඩී.එම් කෝසල තිළිණ අංජු මයා සහ දෛනික පදනම් මත සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරු කේ.ඒ.සී ලක්රුවන් බණ්ඩාර මයා යන අයවලුන් රියදුරු තනතුරෙහි සේවයේ යොදවා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම රියදුරන්ට බරවාහන බලපත්‍ර තිබේද යන්න ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ බලපත්‍ර ඇති බවත්, ප්‍රවීණතා විභාගයෙන් සමත් වී ඇති බවයි.

පසුගිය සභාවාරවලදීත් පවතින රියදුරු පුරප්පාඩු පිරවීමට සභාවේ සිටින අයට අවස්ථාව ලබා දෙන ලෙස යෝජනා කළ බවත්, බාහිර පාර්ශවකින් එම පුරප්පාඩු පිරවුවහොත් මෙහි සිටින අයට එයින් අසාධාරණයක් වන බවත්, ඒ සඳහා සිටින සේවකයන්ට අධ්‍යාපන සුදුසුකම් නැතිනම් ඔවුන් වෘත්තීය පුහුණුවක් සඳහා හෝ යොමුකර එම අවස්ථාව සලසා දෙන තමන් එහිදී ප්‍රකාශ කළ බවත්, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ එම තනතුරු නාම වෙනස් කිරීම් සම්බන්ධ ගැටලුවක් පවතින බවත්, ඉහත මන්ත්‍රීතුමා අදහස් කරන්නේ තනතුරු නාමය වෙනස් කිරීමක් ගැන නොවන බවත්ද යන්න විමසන ලදුව ගරු ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ මීට කලින් රැකියා ලක්ෂයේ රැකියා ලාභීන්ගේ තනතුරු නාමය

දෙවෙනි පියවරේදී වෙනස් කර ලබා දුන් බවත්, එහිදී ඔවුන් රැකියාවට අදාළ පත්වීම් ලිපිය බාර නොගෙන එලෙස වෙනස්කරගෙන ඇති බව පැවසුවද, කොලොන්නෙ ගිහිල්ලා වැඩ කරලා ඇවිල්ලත් තනතුරු නාමය වෙනස් කරගෙන ඇති බවත්, එබැවින් මෙහි සිටින අයටද එම අවස්ථාව ලබා දිය යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ඒ පිළිබඳ විමසීමක් කළ බවත්, ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් මැදිහත් වන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:07** නගර සීමාව තුළ කොණ්ඩා කපන ස්ථාන හා රූපලාවන්‍යාගාරවලින් ඉවත් කරන කෙස්කොට වැනි සනීපාරක්ෂක කසළ බැංකියවත්ත ඝණඅපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට රැගෙන යාමෙන් පසුව එම කසල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියකට භාජනය කළ නොහැක. එම නිසා එකී කෙස්කොට සඳහා වන සුදුසුම ක්‍රමවේදය එම සනීපාරක්ෂක කසළ ලබා ගන්නා ආයතනයකට ලබාදීම වන බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව වැඩිදුර කරුණු මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගෙන් පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා කරුණු පැහැදිලි කිරීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව කාරක සභාවේදී සාකච්ඡා කරගත් කරුණු අනුව කොණ්ඩා කපන ස්ථාන හා රූපලාවන්‍යාගාර හිමිකරුවන් ගෙන්වා දැනුවත් කිරීමක් සිදුකර අපද්‍රව්‍ය ලබාගන්නා ආයතන සම්බන්ධීකරණය කරදීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

පෙ.ව.11.15ට පමණ සභාව මුදල් කාරක සභාවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදුව

පෙ.ව.11.34ට පමණ නැවත ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදි.

**06:01:08** 2026 ජූනි මස ඉන්ධන බිල්පත් පියවීම වෙනුවෙන් BKJ Petroleum වෙත රු.1,019,255.64 ගෙවීම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:09** බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ කටයුතු සඳහා ටෙන්ඩර්කරු වෙත 2026 ජූනි මස ගෙවීම රු.1,098,000.00 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:10** 2026 ජූනි මස දෛනික වැටුප් වෙනුවෙන් රු.1,782,321.82 ක් ගෙවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් පැවසූයේ බෙදීමකට යාමට අවශ්‍ය නම් බෙදීමකට යා හැකි බවයි. මෙහිදී බලන්ගොඩ නගර සභාවේ දැනට පවතින සෞඛ්‍ය කම්කරු පුරප්පාඩු 03 ට අදාළව පිටින් ශ්‍රමය මිලදී ගන්නේ නම් ඒ සඳහා තමාගේ සම්පූර්ණ කැමැත්ත ප්‍රකාශ කරන බවත් ,එම 09 දෙනාට අමතරව මිලදී ගන්නේ නම් ඊට විරුද්ධ වන බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච් එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

මේ අතර ඉහත යෝජනාව සම්බන්ධයෙන් බෙදීමකට යා යුතු බවට ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එම්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික

මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය මේ විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා ඉහත 06:01:10 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් විවෘත ඡන්ද විමසීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට දැනුම් දෙන ලදී.

ඉහත 06:01:10 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා
02. ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 04 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
03. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
04. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

එකී යෝජනාවට ඡන්දය දීමෙන් වැළකී සිටි ගරු සභිකවරුන් 04 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා
03.ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

ලෙස ගරු සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ඉහත යෝජනාව වැඩි ඡන්ද 04 කින් සභා සම්මත විය.

**06:01:11** පහත නම් සඳහන් ශිෂ්‍යාවන් විසින් අප ආයතනයේ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ඉල්ලා සිටින අතර අදාල පුහුණුවීම 2026.07.15 දින සිට ලබා ගැනීම සඳහා වන සභා අනුමැතිය ලබා ගැනීම.

| නම | ලිපිනය | ජා.හැ.අං. | ආයතනය | අවශ්‍ය පුහුණුව | කාල සීමාව |
|---|---|---|---|---|---|
| කේ. එල්. චමුදි දිනේත්‍රා | අංක 187, කිරිඳිගල, බලංගොඩ | 200583702736 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | තොරතුරු තාක්ෂණය සම්බන්ධව | මාස 06 |
| එම්. එම්. රුක්මාලි | තලකොලහින්න, මාවෙල, බලංගොඩ | 997583051V | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | තොරතුරු තාක්ෂණය සම්බන්ධව | මාස 06 |
| පී. ඩබ්. අයි. රුවන්මාලි | ඉදිරියතලාව, මාවෙල, බලංගොඩ | 200466702076 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | තොරතුරු තාක්ෂණය සම්බන්ධව | මාස 06 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් පුහුණුවීම් අතරතුර ආයතනයේ තොරතුරු තාක්ෂණය සම්බන්ධව සිදුකරගත යුතුව පවතින කාර්යයන් තිබේනම් ඔවුන් ඒ සඳහා යොමු කරන ලෙසයි.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:12** සම්පත් පියස ඉහළ මහලේ කඩ කාමර ඉදිකිරීම සඳහා වන ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසූයේ සම්පත් පියස ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ තනි කඩ කාමරයක් සඳහා රු.3,790,000ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවත්, එකී ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් මෙම ගොඩනැගිලි සැලසුම අනුමත කරගෙන ඉදිකිරීම කරන්නේද යන්න විමසන ලදුව ගරු

සභාපතිතුමා එම ඉඩම සභාව සතු වන බවත්, ගොඩනැගිලි සැලසුම අනුමත කරගෙන ඉදිකිරීම සිදු කරන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:13** බළන්ගොඩ නගර සභාව සතු තානායම වර්ෂ 03ක කාලයක් සඳහා බදු වශයෙන් ලබා දීමට සුදුසු බදුකරුවෙක් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීමට සහා අනුමැතිය ලබා ගැනීම.
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් රු.350,000.00 ක තක්සේරු මුදලක් තානායම සඳහා ලබා ලබාදී ඇති බවත්, එම මුදල අවම ලංසුව ලෙස යොදාගෙන තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බවත් සභාව වෙත දන්වන ලදී.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ දැනටමත් තානායමේ අලුත් වැඩියාවන් සඳහා ලබාගත් ණය මුදලක් පවතින බැවින් මෙම කටයුතු කඩිනම් කරන ලෙසයි.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:14** බළන්ගොඩ නගර සභාව සතු තානායම වර්ෂ 03ක කාලයකට බදු දීම සඳහා වූ ගිවිසුම් කෙටුම්පත සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසූයේ මෙම ගිවිසුම් කෙටුම්පත පිළිබඳව සභාව දැනුවත් කිරීමට ආදායම් අංශ ප්‍රධානී මහතා වෙත අවස්ථාව ලබාදීම සඳහා කාරක සභාවක් බවට පත්කිරීමට යෝජනා කරන බවයි. ඒ අනුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ලේකම්තුමිය සහ ආදායම් අංශ ප්‍රධානී කරුණු දක්වන ලද අතර ගිවිසුම් කෙටුම්පත පිළිබඳව විශේෂයෙන්ම මුදල් ඇපයක් තබා ගැනීම අත්‍යාවශ්‍යම බව පෙන්වා දෙන ලදී.නැවත කාරක සභාව මහ සභාව බවට පත්කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.අවසානයේ ගරු සභාපතිතුමා පැවසුවේ තානායම ටෙන්ඩර් කිරීමට ගිවිසුම් ගතවීමට පෙර විශේෂ මහසභාවක් කැඳවා ගිවිසුම පිළිබඳව සාකච්ඡා කිරීම සුදුසු බවයි.

**06:01:15** බළන්ගොඩ නගර සභාවේ ඉම්පීරියල් කඩ ,පදික කඩ පිළිබඳ ලිපි ගොනුව පරීක්ෂා කිරීමේදී 1997.11.27 දිනැති මහ සභාවේ තීරණ අංක 5.11 අනුව ඉම්පිරියල් ඉදිරිපස පදික කඩ 14 සඳහා දිනකට රුපියල් 10 ක ගාස්තුවක් අයකරගැනීම වෙනුවට මාසිකව රු600.00 බැගින් අයකිරීමේ තීරණය යටතේ මාසිකව කුලිය අයකරගෙන ඇත.

2013.11.26 දිනැති මහ සභාවේ තීරණ අංක 6.26 අනුව ඉම්පිරියල් ඉදිරිපස පදික කඩයක මාසික කුලිය රු.1500.00 බැගින් අයකිරීමට තීරණයකර ඇති අතර 2014 වර්ෂයේ සිට මාසිකව ගාස්තුව රු.1500.00 අයකිරිම සිදුකර ඇත.

ඉම්පීරියල් ඉදිරිපිට කඩ හිමියන් සමග බළන්ගොඩ නගර සභාව මෙතෙක් ගිවිසුම්ගත වීමක් සිදුව නොමැත. පදික බිම් තීරුවේ කඩ හිමියන්ගේ වියදමින් ,මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග රක්ෂිතයේ මෙම පදිකකඩ ඉදිකරගෙන ඇති බවට තොරතුරු අනාවරණයවේ.

මෙම පදික කඩ හිමියන් නිසි පරිදි පදික කඩ කුලිය ගෙවීම් සිදුනොකරයි.පදික කඩ හිමියන් සමග ගිවිසුම්ගතවීමක් සිදුව නොමැති හෙයින් පදික කඩ නගර සභාවට පවරා ගැනීමටද හැකියාවක් නොමැත. එබැවින් පදික කඩ මාසික ගාස්තු නිසි පරිදි අය නොවීම විගණනයට ලක්විය හැකි හෙයින් ඉදිරි සුදුසු ක්‍රියාමාර්ගක් ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා කරුණු පැහැදිලි කරමින් පැවසුයේ මෙම කඩ කාමරවල සමහරක් කඩ හිමියන් කුලී ගෙවීමක් සිදුකළද සමහර කඩ හිමියන් කුලී ගෙවීමක් සිදු නොකරන බවත්, නීත්‍යානුකූල අයිතියක් නොමැති බැවින් ඒ පිළිබඳව පියවර ගැනීමට නොහැකි වී ඇති බවත්, නමුත් මෙහි ඉදිරි පියවර සම්බන්ධව තීරණයක් ගත යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා, මාර්ග සංවර්ධන අධිකාරී මායිම නිර්ණය කරවා ගැනීම සුදුසු බව පැවසූ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පැවසුවේ අප මෙය අවුරුදු 20කට වඩා කාලයක් භුක්ති විඳින බැවින් සභාවට මෙය අයිති බවයි.

අනතුරුව පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර මේ පිළිබඳව උපදෙස් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා සභාවට දන්වන ලදී.

**<u>06:02 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා</u>**

**06:02:01** සභිකයන් සඳහා වෙන් කරන ලද රු.500,000 ක්වූ මුදල කුමාරගම විහාරස්ථානය දෙසට යන මාර්ගයේ අතුරු මාර්ගයක් වන එම්.ඞී සිරිසේන මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යොදවන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**<u>06:03 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා</u>**

**06:03:01** මුගුණමලේ මාර්ගය නඩත්තු නොකිරීම හා වෙසක්, පොසොන් උත්සව අවසන් වීමෙන් අනතුරුවත් සෝලා විදුලි බල්බය සවි නොකිරීමට නොහැකිවීම පිළිබඳව ගම්වාසීන්ගේ ගෞරවනීය ස්තුතිය පුද කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි_මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් පැවසුයේ විදුලි බල්බය සවි නොකිරීමට නොහැකිවීම යන්නේ අදහස සවි කිරීමට හැකිවූ බව යන්නයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ. එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ ශෛලතලාරාම මාර්ගයට විදුලි බල්බයක් දමා දෙන ලෙස තමන් පසුගිය සභාවකදී යෝජනා කළ බවත්, එය සතියෙන් සිදු කරන බව පැවසුවද සිදු නොවූ බවත්, සභාපතිතුමාගේ වචනය විශ්වාස කර ජනතාවට එය කිවූ බවත්, මෙහි සමහර අයවලුන් සක්කිලියෝ යැයි කීවට තමන්ගේ ජාතකය හොඳ බවත්, කෙසේ හෝ හිටපු සභාපතිතුමා මැදිහත් වී විදුලි බල්බය දැමීමේ කාර්ය සිදුකර ඇති බවත්ය.

එසේම පසුගිය ජලය නොමැති අවස්ථාවක ප්‍රදේශවාසීන්ට ජලය ලබාදීම සම්බන්ධව ද ස්තුතිය පළ කරන බවත්, නගර සභා සභාවේ සිටින බදු මුදල් ගෙවන ජනතාවට එම බදු මුදලින් වැඩක් කිරීමට නොහැකි නම් වැඩක් නැති බවත්, මෙම සභාව නියෝජනය කර වසරක් ගත වුවද මුගුණමලය මාර්ගයේ නඩත්තුව තවම සිදු නොවූ බවත්, ඒ පිළිබඳව ප්‍රශ්නයක් නොමැති බවත් ප්‍රදේශවාසී බදු ගෙවන ජනතාවගේ ගෞරවනීය ස්තුතිය ඒ වෙනුවෙන් සභාවට, ගරු සභාපතිතුමාට පළ කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ප්‍රේමදාස මැතිතුමා අදහස් දක්වමින් පැවසුවේ වෙසක් පෝයට කලින් මෙන්ම පොසොන් පොහොයට කලිනුත් එම විදුලි බල්බය දමා දෙන ලෙස හාමුදුරුවන් පැවසු බවත්,පසුව තමන් සභාවට එය දැනුම් දුන් බවත් පුද්ගලිකව එහිදී අපහසුතාවයට පත් වූ බවත් ,නමුත් එම බල්බය සවිකලේ පොසොන් පොහොයද පසු වී බවත් ඒවා එහෙම වෙන්න දෙන්න බැරි බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුවේ රු. 75000 යෝජනා කළ බල්බ වලින් එම ස්ථානයට බල්බයක් දමා ගැනීමේ හැකියාව තිබූ බවත් කිසිදු අයෙකුගේ වැඩ හිතා මතා නවත්වා නොමැති බවත් ඉතිරි බඩු ටික ලැබී ඇති බැවින් ඉදිරියේදී ඒවා සිදුකරන බවත්, යොදවා ඇති සේවකයන්ට දෛනිකව කිරීමට රාජකාරි පවරා තිබුණද අවශ්‍යතාවය අනුව සමහර අවස්ථාවල ඒවා වෙනස් කිරීම් සිදුවන බවත්, කිසිම අයෙකු අපහසුතාවයට ලක් කිරීමේ කිසිදු චේතනාවකින් වැඩ කටයුතු සිදු නොකරන බවත්ය.

**06:03:02** අල්ලස් චෝදනා විමර්ශන කොමිශන් සභාව මඟින් බළන්ගොඩ නගර සභාව සම්බන්ධයෙන් පැවැත්වෙන විමර්ශනයන් පිළිබඳව සභාව දැනුවත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුවේ අල්ලස් කොමිසමේ සිදුවන විමර්ශනයන් පිළිබඳව සභාවේ ප්‍රසිද්ධියේ සාකච්ඡා කිරීම කළ නොහැකි බවත්, එහිදී සිදුවන විමර්ශනයන් සඳහා අවස්ථාව අනුව නිලධාරීන් කැඳවීම් කරන බවත් දළ වශයෙන් පොහොර මිලදී ගැනීමක් සම්බන්ධ විමර්ශනයක්, ජේ.සී.බී යන්ත්‍රයේ සේවා සැපයීම සම්බන්ධව විමර්ශනයක්, බලගහමුල ගොඩනැගිල්ලක් සම්බන්ධ විමර්ශනයක්, මෙම දිනවල සිදුවන බවත් මේ සම්බන්ධව අවසන් ප්‍රතිඵල ලැබී නොමැති බැවින් තවදුරටත් සාකච්ඡා කළ නොහැකි බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටඅආරච්චි මැතිතුමා විසින් පොහොර මිලදී ගැනීමක් සම්බන්ධව පරීක්ෂණයක්ද ක්‍රියාත්මක වෙමින් පවතින බවත් ඒ සම්බන්ධව ප්‍රශංසා සහතිකයක්ද ගසා ඇති බවත් පැවසීය.

<u>**06:04** ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා</u>

**06:04:01** බෝම්බුව පන්සලවත්ත මාර්ගය නඩත්තු කිරීම,කාණු ගොඩ දැමීම සහ සුද්ද කිරීම.

**06:04:02** කරවකැටිය,ගල්වල පාර,වතුකාරගොඩ දක්වා සුද්ද කිරීම,කාණු ගොඩ දැමීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම.

**06:04:03** ආචාරිමලේ කාණු පද්ධතිය සුද්ද කිරීම සහ එළි පෙහෙළි කිරීම.

**06:04:04** ආචාරිමලේ මාර්ගය තුළ මාර්ගය අවහිරවන සේ කලක සිට නවතා ඇති වාහන ඉවත් කිරීම.

**06:04:05** බෝම්බුව ක්‍රීඩා පිටිය අසලින් UC නිවාසවලට පිවිසෙන මාර්ගයේ කොන්ක්‍රීට් බට ඉවත්කර ඒ සඳහා ස්ලැබ් කැට යෙදීම.

**06:04:06** නොම් 38/1,පරගහකුඹර, බෝම්බුව, බළන්ගොඩ යන ලිපිනයේ පදිංචි බී.කේ.ජයසුන්දර මහත්මාගේ නිවස සහ දේපළවලට අනතුරුදායකව පවතින කොස් ගස ඉවත් කිරීම.

ඉහත සඳහන් යෝජනා අංක 06:04:01 සිට යෝජනා අංක 06:04:06 දක්වා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමාගේ යෝජනා, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් බෝම්බුව පන්සල වත්ත මාර්ගය 2019 න් පසුව අද වන තෙක් සුද්ද කර නොමැති බවත්, අඩි 2 පමණ පළල කාණුව වැස වැසී ගොස් ඇති බවත්, නගර සභාව සතු මාර්ගයක්ද යන හිතාගන්න බැරි බවත්,මළ ගෙදරකට මගුල් ගෙදරකට යන්න විදිහක් නෑ මිනිස්සු දොස් කියන බවත්, යෝජනා අංක 06:04:05 මඟින් දක්වා ඇති ක්‍රීඩා පිටියේ ළඟ පාරේ බෝක්කුවේ ධාරිතාව ප්‍රමාණවත් නොවන බවත්, එහි බට ඉවත්කර ස්ලැබ් දමා ලබා දෙන ලෙසත්, එසේම යෝජනා අංක 06:04:06 මේ වන විට ඉටු කර ඇති බවත් ඒ පිළිබඳව ස්තුතිවන්ත වන බවත් පවසන ලදී.ගරු උපසභාපතිතුමාද අදහස් දක්වමින් පැවසූයේ එතුමා සඳහන් කරන ක්‍රීඩා පිටිය ළඟ මාර්ගයේ බට ඉවත්කර ස්ලැබ් දැමීම සුදුසු බවයි.

**ඒ අනුව ඉහත සඳහන් යෝජනා අංක 06:04:01 සිට යෝජනා අංක 06:04:06 දක්වා යෝජනා විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**<u>06:05 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා</u>**

**06:05:01** පල්ලෙවෙල මාර්ගය පිළිසකර කිරීම සහ එම මාර්ගයේ ඉහළ සිටින ජනතාවට ජලය ලබා ගැනීම සඳහා ජල සම්පාදන මණ්ඩලය අනුමැතිය පරිදි ජලනල එළීම සඳහා කාණු කැපීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට යෝජනා කරමි.

**06:05:02** ගල්වල ඉදිරිපිට දොරවෙලට මායිම්ව පිහිටි සභාව සතු ඉඩම street food සඳහා වසර තුනක කාලයකට බදුදීමට යෝජනා කරමි.

**06:05:03** සභාව සතු ගිනි නිවන යන්ත්‍රය පිට පළාත් පාලන ආයතනවලට අදාළ ප්‍රදේශවල ගිනි නිවීම් වලට ලබා දීමේදී එම ලබා දීම වෙනුවෙන් ගාස්තු ලබා ගැනීම සඳහා පළාත් පාලන ආයතන සමඟ ගිවිසුම් ගතව ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනා අංක 06:05:01 සිට යෝජනා අංක 06:05:03 දක්වා ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන_මැතිතුමාගේ යෝජනා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනා පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුයේ පල්ලෙවෙලෙ මාර්ගයේ ඉහළ සිටින ජනතාවට ජලය ලබා ගැනීම සම්බන්ධව ගැටළුවක් පවතින බැවින් ඒ සඳහා ජේ.සී.බී යන්ත්‍රය ඒ සඳහා යෙදවිය යුතු බවත්, සභාවේ පවතින මූල්‍ය තත්ත්වය අනුව ගල් වල ඉදිරිපිට ඉඩම කොටස් කර Street Food ව්‍යාපෘතියේ සඳහා ලබා දීමට යෝජනා කරන බවත්, එහි සැලසුම සභාවෙන් සකස් කරන බැවින් ඒ අනුව ලබාදිය හැකි බවත්,06:05:03 යෝජනාව මගින් සභාවේ ගිනි නිවන රථය සහ බවුසරය පිට පළාත් පාලන ආයතනවලට රාජකාරී සඳහා යන බවත් එහිදී ඔවුන් සමග ගිවිසුම්ගත විය හැකි බවත්, එයින් වියදම ආවරණය කරගත හැකි බවත් පවසන ලදී.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ජලය ලබාදීමේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවයි.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් ගල්වල ඉදිරිපිට ඉඩම කොටස්කර Street Food සඳහා බදු දීමට අදාළ යෝජනාවේ සැලසුම සභාවට ඉදිරිපත් කරන ලදී.අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ සභාව සතු ගිනි නිවන යන්ත්‍රය පිට පළාත් පාලන ආයතනවලට අදාළ ප්‍රදේශවල ගිනි නිවීම් වලට ලබා දීමේදී දැරීමට සිදුවන ඉන්ධන වියදම,වාහනයේ පිරිවැය ආදිය පියවා ගැනීමේ ක්‍රමවේදයක් පිළිබඳව උපදෙස් සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කිරීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ තමන් සිටින කාලයේදීත් මෙසේ සිදුවූ බවත්, නමුත් එසේ ගිවිසුම් ගත වූ පසු එය සභාවේ වගකීමක් බවට පත්වන බවත්, ඒ අනුව අවශ්‍යතාවය අනුව ගිනි නිවීම සඳහා සහභාගී වී එම වියදම ආවරණය කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත්ය.ගරු උපසභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාද පැවසුයේ පළාත් පාලන ආයතන සමග එකඟතාවක් ඇතිකරගෙන දැරීමට සිදුවන පිරිවැය ආවරණය කරගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ගැනීම සුදුසු බවයි.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුවේ

තමා ඉහත යෝජනා කර ඇත්තේ ද පළාත් පාලන ආයතන සමඟ ගිවිසුම් ගතවීම සුදුසු වන බවට බවයි.

**ඒ අනුව ඉහත සඳහන් යෝජනා අංක 06:05:01 සිට යෝජනා අංක 06:05:03 දක්වා යෝජනා විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:06 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**06:06:01** දෙහිගස්තලාව අල්මිනාරා පාසලට පිවිසෙන මාර්ගය කඩිනමින් අළුත්වැඩියා කිරීම.

**06:06:02** මිරිස්වත්ත මුස්තාපාමාවත සිට එෆ්.එච් මාවතට පිවිසෙන මාර්ගය තාරදමා සංවර්ධනය කිරීම.

**06:06:03** ගොරොක්ගහමඩ බෙතල්හිල් මාවත උඩ කොටස අඩි 100ක් පමණ දුර සංවර්ධනය කර නිම කිරීම.

**06:06:04** මිරිස්වත්ත සුබයිආලීම් මාවත අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනා අංක 06:06:01 සිට යෝජනා අංක 06:06:04 දක්වා ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමාගේ යෝජනා, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින්, දෙහිගස්තලාව අල් මිනාරා මාවත සම්පූර්ණයෙන්ම මේ වන විට අබලන්වී ඇති බවත්, ගොරොක්ගහමඩ බෙතල්හිල් මාවත 2001 එකේ සිට තමන් මෙම සභාවේ සිටියද තමාගේ නිවසට යන මාර්ගය මේ වන තෙක් සාදාගෙන නොමැති බවත්, එහි තව අඩි 50ක් පමණ සකස් කිරීමට ඉතිරිව ඇති බවත්, එය සම්පූර්ණ කර දෙන ලෙසත්, සුබයිර්ආලිම් මාවතත් සම්පූර්ණයෙන්ම අබලන්වී ඇති බවත්, අවුරුදු 2-3ක්ම එය අලුත්වැඩියා කිරීමට උත්සාහ කළ නමුත් මේ වන තෙක් සිදුවී නොමැති බවත්, ඒ අනුව එම මාර්ග අලුත්වැඩියා කිරීම් කර දෙන ලෙසත්ය.

**ඒ අනුව ඉහත සඳහන් යෝජනා අංක 06:06:01 සිට යෝජනා අංක 06:06:04 දක්වා යෝජනා විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:07 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා**

**06:07:01** අබලන් වී ඇති මාළිගාතැන්න මාර්ගය පිළිසකර කිරීම.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:08 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**06:08:01** කරව්කැටිය උඩකන්ද පාර කාණු හා දෙපස පිරිසිදු කිරීම.

**06:08:02** කුමාර විද්‍යාලය ඉදිරිපිට මාර්ගයේ ගස්වල අතු ඉවත් කිරීමට කටයුතු කිරීමට යෝජනා කරමි.

**06:08:03** මාර්ග සංවර්ධන අයත් කාණු පද්ධති නිසියාකාරව සුද්ද කිරීමට ඔවුන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනා අංක 06:08:01 සිට යෝජනා අංක 06:08:03 දක්වා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා, ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනා සම්බන්ධව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කළේ, කරව්කැටිය උඩකන්ද පාර කාණු හා දෙපස පිරිසිදු කිරීමට යොමුකළ 7-8වැනි සිහිකැඳවීම බවත් කරව්කැටිය උඩ කන්ද මාර්ගය සභාව පටන් ගත් පසුම සුද්ද කර නොමැති බවත්,මහමෙව්නාවට හැරෙන ස්ථානයේ වතුර ලීක් එකක් පවතින බවත්, එය පිළිසකර කර දෙන ලෙසත්, කුමාර විද්‍යාලයේ ගස්වල අතු වැටි ඒවා කඩා වැටෙන්න ආසන්න බැවින් අනතුරක් සිදුවිය හැකි බැවින් ඒ පිළිබඳවද සොයා බලන ලෙසත්,මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, ඕලුගන්තොට ඩයමන්ඩ් හෝල් එක ඉදිරිපිට කාණුව පිරී ඇති බවත්,ඩෙංගු වසංගතය හේතුවෙන් රට තුළ මේ වන විට ඩෙංගු රෝගීන් 67,000ක් පමණ සිටින බවත්, කිසිම රජයකින් මේ ආකාරයට ඩෙංගු වසංගත තත්ත්වයක් ඇති නොවූ බවත්, clean sri lanka ව්‍යාපෘතිය යටතේ හෝ මේවා පිරිසිදු කරන ලෙසත්, ලැබී ඇති ප්‍රතිපාදන වලින් අවස්ථාව ලබා දෙන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසුවේ ඉහත සාකච්ඡා කළ බොහෝ යෝජනාවල කාණු සම්බන්ධව ගැටලුව පැවති බවත්, මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බවත්, ඒවා දැනට පටන් ගෙන ඇති බවත්, සභාවේ සේවකයන් ප්‍රමාණය අනුව කර ගැනීමට නොහැකි බවත්, පසුගිය දිනක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නගර සභාව බල ප්‍රදේශයේ ප්‍රජා කමිටු සභාපතිවරුන් සහ නිලධාරීන් ගෙන්වා සාකච්ඡාවක් පැවැති බවත්, එහිදී ඩෙංගු

වසංගතය පිළිබඳව සාකච්ඡා කළ බවත්, ඒ අනුව එම කොට්ඨාසවල පිරිසිදු කටයුතු ක්‍රියාත්මක වනු ඇති බවත්, තම තමන්ගේ කොට්ඨාස මට්ටමෙන් හෝ ශ්‍රමදාන සිදුකිරීම සුදුසු බවත්, කොට්ඨාශවල ඩෙංගු වසංගත තත්ත්වයට මුහුණ දීමට ශ්‍රමදාන කටයුතු සිදුකිරීමට සැලසුම් කරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ වාහන සභාවෙන් ලබා දෙන බවත්, මේ පිළිබඳව දැඩි අවදානම් පවතින ස්ථාන පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා දැනුවත් කරන ලෙසත්ය.

**ඒ අනුව ඉහත සඳහන් යෝජනා අංක 06:08:01 සිට යෝජනා අංක 06:08:03 දක්වා යෝජනා විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනෙක විද්‍යාලෝක විද්‍යාලයට අගමැතිතුමිය පැමිණි බවත් එහිදී නගරයේ බැනර් කටවුට් ඉවත් කළ බවත්, නමුත් එහිදී නගරයේ පැවති ලේ දන්දීමේ වැඩසටහනක බැනරයක්ද ඉවත් කර තිබූ බවත්, එවැනි මිනිසුන්ගේ උන්නතිය වෙනුවෙන් සිදුකරන වැඩසටහන් සඳහා එසේ සිදු නොකරන ලෙසත් පැවසූ අතර ගරු සභාපතිතුමා පැවසුයේ ඒ පිළිබඳව සොයා බලන බවයි.

## 08. කාරක සභා වාර්තා සලකා බැලීම

ගරු නාගරික මන්ත්‍රී හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුවේ පසුගිය 6/16 වැනි දින මුදල් කමිටුවේදී සම්පත් පියස මධ්‍යස්ථානයේ අලුත්වැඩියාවක් සම්බන්ධව යෝජනා අංක 6 ට අදාළව එම බිල්පත අනුමත කර ලබා දුන්බවත්, සභාවේ හොඳ දේවල් සිදුවීමේදී කවදාවත් ඒවාට විරුද්ධ වී නොමැති බවත් නමුත්, එය පසුගිය 23වෙනිදා මුදල් කමිටුව වෙත නැවත ඉදිරිපත් කර තිබූ බවත්,එහිදී තමා ප්‍රශ්න කල විට වැඩ අධිකාරිතුමා පැවසූයේ ගිවිසුම්ගත වී ඇත්තේ 06/05 දින බවත්, හැකියා සහතිකය ලැබී ඇත්තේ 06/10 දින බවත්, පසුව උප සභාපතිතුමාට සහ කර්මාන්ත කමිටුවේ සභාපතිතුමාට එම සමිතියට මුදල් ගෙවීමට සැහෙන උනන්දුවක් තිබූ බවත්, ඒ අනුව මෙම සමිතියට කොන්ත්‍රාත් පිරිනැමීමේ දී හැකියා සහතිකයක් නැතිව කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති බවත්, සභාව නොමඟ යවා ඇති බවත්, ගිවිසුම් අත්සන් කරන්නේද නැතිව සභාවේ මුදල් ගෙවීමට පුදුම හදිසියක් තිබූ බවත්, සමිතියට යවපු ලියුමක්වත් නොතිබූ බවත්, මෙයද අල්ලස් කොමිසමට යනු ඇති බවත්, ගිවිසුම අත්සන් නොකර එම වැඩිහිටි සමිතියට මුදල් ගෙවීමට අනුමත කරගත් බවත්, මේ පිළිබඳව කරුණු සෙවීමේදී සේනක පෙදෙසේ එම සමිතිය අයිත් බව දැන ගන්න ලැබුන බවත්, පසුගිය කාලයේ වුණා දැන් එහෙම වුණාට කමක් නෑ වැනි තීරණ ලබා නොගන්නා ලෙසත්,එවැනි දේවල් ජනතාව බලාපොරොත්තු නොවන බවත්, මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුවෙනු ඇතැයි තමා බලාපොරොත්තු වන බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ එම අවස්ථාවේ සම්පත් පියස කඩකාමරවල ටෙන්ඩර් කිරීම සඳහා අවශ්‍යතාවයක් පැවති බැවින් වාචිකව දැනුම් දී මෙය සිදු කළ බවත් එසේ නොකළා නම් ටෙන්ඩර් කළ දිනට එම කඩ කාමරවල මෙම අලුත් වැඩියාවන් සිදු කළ නොහැකි බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ විනිවිදභාවය පෙනිය යුතු කරුණුවල විනිවිදභාවය තිබිය යුතු බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුවේ සත්‍යය නම් මෙහි කොන්ත්‍රාත් සීයක් අත්සන් කරන්නේ නම් ඒවා සියල්ල අතුරුබඳු ලබා දෙන බවයි.

2026.06.16 ,2026.06.23,සහ 2026.07.02 යන දිනයන්හි පැවති මුදල් කාරක සභා වාර්තා සහ 2026.06.11 දිනැති පරිසර සෞඛ්‍ය හා සණඅපද්‍රව්‍ය කළමණාකරණ කාරක සභා වාර්තාව මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර විරෝධතා නොවූ හෙයින් එකී වාර්තා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම

**2026 මැයි මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.15,226,035.61 |
| මූලධන ලැබීම් | රු.5,064,046.86 |
| වෙනත් ලැබීම් | රු.2,559,732.55 |
| මුළු ලැබීම් | රු.22,849,815.02 |
| පුනරාවර්තන වියදම් | රු.14,942,440.24 |
| ප්‍රාග්ධන වියදම් | රු.1,652,795.28 |
| වෙනත් වියදම් | රු.5,628,337.31 |
| මුළු වියදම් | රු.22,223,572.83 |

**2026 ජූනි මස ඉන්ධන වාර්තාව**

| **2026 ජූනි ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල (රු) |
| 226-7521 | 51,962.85 |
| 227-5020 | 40,303.85 |
| 56-1906 | 31,473.31 |
| BC 0005 | 24,420.00 |
| GC 0001 | 38,610.00 |
| GK 1483 | 179,506.66 |
| JD 4684 | 4808.72 |
| ND 5124 | 49,247.81 |
| ZA 5039 | 7840.00 |
| MM 8152 | 2170.00 |
| LL 2110 | 19,600.00 |
| SDR | 7840.00 |
| DDR | 1628.00 |
| RD 8240 | 30,457.00 |
| PF 4006 | 64,520.00 |
| RC 1107 | 55,715.81 |
| RC 1118 | 58,415.81 |
| RD 8000 | 40,704.07 |
| ZA 9835 | 104,841.00 |
| QL 2901 | 3038.00 |
| 37-7933 | 16,130.00 |
| HF 8558 | 46,805.81 |
| GK 6227 | 12,820.00 |
| HF 7899 | 102,763.04 |
| RE 2600 | 38,771.81 |
| ධූමායන කටයුතු | 12,345.00 |
| **TOTAL** | 1,046,738.55 |

2026/06/30 දිනට ගබඩාවේ ඉතිරි ඉන්ධන රු.197,531.00

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා අදහස් දක්වමින් නාගරික සංවර්ධන අධිකාරි ඉඩමේ රථ ගාල සඳහා තවමත් බස් රථ ඇතුල් කිරීම සිදු නොකරන බවත්, ඒ අනුව සභාව මාසිකව ගෙවිය යුතු මුදල ගෙවීමට නොහැකි බවත් පැවසූ අතර මෙහිදී ගරු සභාපතිතුමා පැවසූයේ ඒ සම්බන්ධව මේ වනවිට පොලිසිය දැනුවත් කර ඇති බවත්, මෙම මස 21 වැනි දා සභාවට පොලිසිය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සහ පාසල් බස් රථ හිමියන්ගේ සංගමය යන පාර්ශව ගෙන්වා මේ පිළිබඳව සාකච්ඡාවක් සිදු කරන බවයි.ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා නැවතත් අදහස් දක්වමින් සභාවේ ගිනි අවියක් අධිකරණයේ නඩු භාණ්ඩයක් ලෙස පවතින බවත්, එහි නඩු කටයුතු අවසන් බැවින් එය ලබාගත හැකි බවත්,එය හැකි

ඉක්මනින් ලබා ගන්නා ලෙසත් එමෙන්ම මෙම දිනවල කොන්ත්‍රාත්කරුවන්ගේ විශාල ගැටලුවක් පවතින බවත්, ඒ පිළිබඳවද හැකි ඉක්මනින් බලන ලෙසත් වෙනදා මෙහි කොන්ත්‍රාත්කරුවන් හොයාගෙන පැමිණියද දැන් එය වෙනස් වී ඇති බවත්, කරපු වැඩ මාස 9-10වෙනකල් ගෙවා නැති බවත්, ත්‍රිරෝද රථය සම්බන්ධව ඉල්ලීම පළාත් පාලන අමාත්‍යංශයට ගොස් ඇති බැවින් ඒ පිළිබඳව පසු විපරම් සිදුකරන ලෙසත් ,මෙහි සතියෙන් වාහන ගෙනාපු සභාපතිවරුන් සිටි බවත් පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ මෙම දිනවල පවතින තාර සම්බන්ධ ගැටලුව හේතුවෙන් කොන්ත්‍රාත් ලබාගැනීම සම්බන්ධව ගැටලු මතුවී ඇති බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් සයිලන්සරයක ඡායාරූපයක් පෙන්වා ගරාජයට ඇතුළත් කරන විට තිබූ සයිලන්සරයේ ඡායාරූපය සහ දැනට දමා ඇති සයිලන්සරයේ ඡායාරූපයේ දැන් තත්ත්වය පෙන්වා මේ පිළිබඳව සොයා බලන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් සභාවේ හොඳ යෝජනා සඳහා සම්පූර්ණ සහයෝගය මෙතෙක් ලබා දී ඇති බවත්, ඒ වගේම තමන් යෝජනා කරන දේවලුත් ක්‍රියාත්මක කරන ලෙසත් රෝහලට යාමේදී මගීන්ට ඒ සඳහා වැය කිරීමට සිදුවන කාලය සම්බන්ධ වූ තමන් කතා කළා එමෙන්ම පසුගිය සභාවේදී පොල නිරීක්ෂණය සම්බන්ධ යෝජනා කළා එම එක් කරුණාවකටවත් මේ වනතෙක් පිළිතුරක් නොමැති බවත්, කල්තොට මාර්ගයේ දිගටම පුද්ගලික බස් නතර කර ඇති බවත්, එම බස් රථ සියල්ල රථ ගාලට දමා ගැනීමේ හැකියාව ඇති බවත්, එයින් ආදායම සභාවට ලබාගත හැකි බවත්, කල්තොට හැරෙන හන්දියේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුවත් සිටිය යුතු බවත්, එමෙන්ම කාර් පාක් හන්දියේත් පොලිස් නිලධාරීන් සිටිය යුතු බවත්, ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් බණ්ඩාරවෙල නගරයේ පැය 24ම පාරේ පොලිසියෙන් සිටින බවත්, ඒ අතින් අප හරි දුර්වලයි යන්නත්, මහජනයාගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදෙන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් වසර ගණනාවක් තිස්සේ බළන්ගොඩට අවශ්‍යතාවයක්ව පැවති ධීවර සංස්ථාවෙන් මාළු කඩයක් දමා ඇති බවත්, ඒ පිළිබඳව බලන්ගොඩ ජනතාව ඉමහත් සතුටට පත් වූ බවත්, නමුත් මේ වන විට එහි විවිධ අකටයුතුකම් සිදුවන බවත් පාරිභෝගිකයන්ගෙන් මාළු ප්‍රමාණය අඩුයි කියා පැමිණිලි ලැබෙන බවත්, තමන්ටද පෞද්ගලිකවම එය සිදු වූ බවත්, ඒ සම්බන්ධව සොයා බලන ලෙසත් පැවසූ අතර ගරු සභාපතිතුමා පැවසුවේ ඒ පිළිබඳව එම චෝදනාව තමන්ටද ලැබුණ බවත් එහි දැනට සීසීටීවී සවිකර ඇති බව කළමනාකරු පැවසූ බවත්, එය කළමනාකරු නිරීක්ෂණය කරන බවත්ය. ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය නැවතත් අදහස් දක්වමින් කසල බඳුන් සම්බන්ධව ආයතනයක් සම්බන්ධ කරගෙන clean sri lanka යටතේ හෝ ඒ ලබාදෙන ලෙසත් උඩ කන්ද පාරේ ට්‍රැක්ටර් යන්න බැරි පාරවල් වලට ලබා දෙන ලෙසත්, තැන් තැන්වලට කුණු ගෙනත් දාන බවත්, එමෙන්ම සුසාන භූමිය සම්බන්ධව පසුගිය පරිසර කමිටුවේදීත් සාකච්ඡා කර තිබූ බවත්,එහි පවතින ගැටලු තවම විසඳා නොමැති බවත් එයට සිටි මුරකරුම හෝ යොදවා එම කටයුතු විධිමත් කරන ලෙසත් පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසුවේ ආයතනයක් සමඟ මේ වන විට සාකච්ඡා කර ඇති බවත් ඉදිරියේදී එය විධිමත් වනු ඇති බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මහජන පොලේ ත්‍රීවිල් රථ අක්‍රමවත්ම නතර කර ඇති බවත්, පොළ දවසට එහි වෑන්ඩි සිටින බවත්, එහි පොලේ පාරිභෝගිකයන්ට ඇතුල්වීමට හෝ නොහැකි බවත්, එමෙන්ම තවත් ගැටලුවක් ලෙස මෙම දිනවල බලංගොඩට යාචකයෝ ගෙනත් දාන බවත්, ඊයේ පසුගිය තානායම් පිවිසුම් පාරේ අශෝභන ආකාරයට යුවළක් රණ්ඩු කරමින් හැසිරුන බවත්, මෙම පිරිස් බළංගොඩ පුද්ගලයන් නොවන බවත්, මේවායේ පිටුපස සිටින්නේ මුදල් උපයන කණ්ඩායම් බවත්, මේ පිළිබඳව සොයා බලන ලෙසත්, එමෙන්ම බලංගොඩ නගරයේ පවතින සතොස ගොඩනැගිල්ලෙ මේ වන විට කැලි කැලි කැඩී වැටෙන බවත්, ඒ සම්බන්ධව හිටපු සභාපතිතුමාද කතා කල බවත්, එයින් ලොකු විනාශයක් වීමට පෙර ඒ සම්බන්ධව තීරණයක් ලබා ගන්නා ලෙසත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් සභාපතිතුමා ඇතුළු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාට ස්තුතිය පුද කරන බවත්,ලක්ෂ 75ක පමණ විශාල සංවර්ධන මුදලක් ලබාදී ඇති බවත්, මෙහි පක්ෂ භේදයක් නැති බවත්, බලංගොඩ

නාගරික මන්ත්‍රී සියලු දෙනාම ජනතාවට වැඩ කිරීමේදී එකම පක්ෂයේ බවත්, තමන් ගොඩක් සතුටු වන බවත්, තම කොට්ඨාශයටද මුදල් දීම ගැන විශේෂයෙන් ස්තූතිය නැවත නැවතත් පළ කරන බවත් ,එමෙන්ම කුණු ට්‍රැක්ටරේ සිට සභාපති නිල රථය දක්වා සභාවේ සියලු වාහනවල රියදුරු වූ ලාල් මහතා බලන්ගොඩ නගර සභාව වෙනුවෙන් ඉමහත් සේවයක් කළ බවත්,එතුමා මේ වෙන විට වෙනත් ආයතනයකට ස්ථාන මාරු ලැබ ගොස් සිටින බවත්, එමෙන්ම අද දින සභාවෙන් විශ්‍රාම පූර්ව නිවාඩු යන ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරීතුමිය කැඳවීමට තමන් පැවසූ බවත්, එතුමියද අවුරුදු ගණනාවක් බලන්ගොඩ නගර සභාවට ඉමහත් සේවයක් සිදුකළ නිලධාරිනියක් බවත්, එමෙන්ම තමන්ද අවුරුදු 35ක පමණ රජයේ සේවකයෙක් බවත්, මන්ත්‍රීවරුන් පත් වන්නේ ඡන්දයෙන් බවත් රජයේ සේවකයන් ඉතා අමාරුවෙන් අධ්‍යාපනය ලබාගෙන එම ස්ථානවලට පත්වන බැවින් ඔවුන්ට හිමි ගරුත්වය ලබා ලබාදිය යුතු බවත්, මෙහි සමහර මන්ත්‍රීවරුන්ගේ හැසිරීම ඉතා අන්තිම බවත් රාජ්‍ය සේවකයාගේ හිත රිදවා පලක් නොමැති බවත්, එබැවින් තමන් මෙම සභාවෙන් ගෞරවයෙන් ආදරයෙන් රජයේ සේවකයන් දෙස බලන ලෙස ඉල්ලා සිටින බවත්, මොන ගැටලු පැවතියද සියලු දෙනාගේ ප්‍රධානියා සභාපතිතුමා බැවින් අවශ්‍ය ගැටලු සභාපතිතුමා වෙත ඉදිරිපත් කර පසුව ලේකම්තුමිය මගින් නිලධාරීන් මගින් එහෙම ගැටලු විසඳා ගත හැකි බවත්, ආයතනයෙහි ප්‍රධානියා ලේකම්තුමිය බවත් මින් ඉදිරියට මෙවැනි දෙයක් සිදු නොවේවා යන්න තමන් ප්‍රාර්ථනා කරන බවත් එමෙන්ම කුණු අදින සේවකයාගේ සිට ලේකම්තුමිය දක්වා වන සියලුම නිලධාරීන්, සේවකයන් සමගම ගරුත්වයෙන් ආදරයෙන් සැලකිය යුතු බවත් සභාවට මතක් කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් වෙනත් කරුණු න්‍යාය පත්‍රයට අවශ්‍ය නොවන බව පැවසුවද එහි නීත්‍යානුකූල තත්ත්වයක් නොතිබුනද න්‍යාය පත්‍රයේ නොමැති දේවල් පිළිබඳව වුවද මෙහිදී සභාව දැනුවත් කළ හැකි බවත්, තමන් මෙම සභාවේ කාලයක් තිස්සේ සිටින බැවින් නිලධාරීන් සමඟ වැඩ කටයුතු කරන ආකාරය සම්බන්ධව පරපුරුද්දෙන්ම දන්නා බවත්, මෙම සභාවෙන් එය දක්නට නොලැබෙන බවත්, මෙම සභාවේදී මන්ත්‍රීවරයෙක් යම් ප්‍රකාශයක් කළ විට එහි වගකීම සම්පූර්ණයෙන් ඔහු ඇය භාරගත යුතු බවත්, සභාපතිතුමා සභාව මෙහෙයවීම සඳහා තවමත් අනුගත වී නොමැති බව පෙනී යන බවත්, තමන් දොස් පැවසීමක් නොව එම අඩුපාඩු හඳාගත යුතු බව සිහිපත් කරන බවත්, හර්ෂණ මන්ත්‍රීතුමා මීට කලින් සිටි සභාපතිවරු හොරු කිවූ බවත් තමන් එහිදී හොරාගේ නම කියවුණේ නැති බව පැවසූ බවත්, හර්ශණ මන්ත්‍රීතුමා දක්ෂ තමන් ප්‍රිය කරන කෙනෙක් බවත්, තමන් පසුගිය වර්ෂයේදී මිහිඳු පෙරහරට මන්ත්‍රී ප්‍රතිපාදන වලින් මුදල් ලබා ගැනීමට යෝජනා කළ ද එහිදී පෙරහැර යන තෙක්ම මුදල් නොලැබුන බවත් තමන් සිටි කාලයේදී මෙහි

කොන්ත්‍රාත්කරුවන්ගෙන් බේරීල්ලක් නොතිබූ බවත්, ඒ වැඩ කළ නිසා බවත් ,එමෙන්ම නදීක මන්ත්‍රීතුමාගේ සහ තමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලට අදාල යෝජනාව ඉදිරි සතියේ හෝ ආරම්භ කරන ලෙසත් එමෙන්ම ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමියගේ සහ ලේකම්තුමියගේ අවසන් සභාවාරය මෙය බවත්, ඔවුන් දෙදෙනාටම සුභ පැතුම් එක්කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11. අවසානය**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තූතිය පුද කරන බව දන්වමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.01.55 ට පමණ අවසන් කරන ලදි.

එන්.ඩබ්.පී.ටී ජයසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.